# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2233/30 - 2023 මැයි මස 26 වැනි සිකුරාදා - 2023.05.26**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය:* KDS/UDP/4/1FR/48.
*ඉඩම් අමාත්‍යාංශයේ අංකය:* 4-3/2/2010/FR/294.

මහවැලි ගඟ සංරක්ෂණය කිරීම සඳහා ඉඩම් අත්කර ගැනීම.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර :*

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, උඩපළාත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 1189, කළුගල්හින්න ග්‍රාම නිලධාරි වසමේ පිහිටි මැණුම්පති විසින් මැන පිළියෙල කරන ලද අංක 320040 (01) 2 දරන කැඩැස්තර සිතියමේ කැබැලි අංක 2 ප්‍රමාණයෙන් හෙක්ටයාර් 2.5000 ක් වන මහවිල වත්ත නම් ඉඩම් කොටස :

**01. අනු. අංකය 1**
ස්ථානය: ගම්පොල උඩපළාත ප්‍රාදේශීය ලේකම් කාර්යාලය; කැඩැස්තර සිතියම් අංකය: 320040(01) 2; වන්දි පරීක්ෂණ දිනය: 2023.07.19; වේලාව: පෙ.ව.10.00; ප්‍රමාණය: හෙක්. 2.5000.

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවට හිමිකම්, අයිතිවාසිකම්, හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 2023.07.19 වැනි දින පූර්ව භාග 10.00 ට උඩපළාත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද, 2023.07.05 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයන් එකී ඉඩම/පරවශතාවයට ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳව විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

ආර්.ඒ.ඩී.ටී.එන්.තෙන්නකෝන්,
ප්‍රාදේශීය ලේකම්,
උඩපළාත කොට්ඨාසය,
ගම්පොල.

2023 මැයි මස 23 වැනි දින,
උඩපළාත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දීය.

EOG 05-0231



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

ශුද්ධි පත්‍රයයි

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

මගේ අංකය : KWDS/LND/01/ACQ/03/2014.
ඉඩම් අමාත්‍යාංශයේ අංකය : 4-3/4/2014/LO/230.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තිය යටතේ ශ්‍රී ලංකා සමාජවාදී ජනරජයේ අංක 1988/38 හා 2016/10/14 දිනැති අති විශේෂ *ගැසට් පත්‍රයේ* 1A පිටුවේ පළ කර ඇති දිනය 2016/11/30 ලෙසත් වේලාව පෙ.ව. 10.00 සඳහන්ව ඇති අතර එය 2023/07/24 හා වේලාව පෙ.ව.10.00 ලෙසටත් සංශෝධනය විය යුතු බව මෙයින් ප්‍රකාශ කරමි.

සංජීවනී කන්ඩම්බි,
ප්‍රාදේශීය ලේකම්,
කලවාන.

2023 මැයි මස 23 වැනි දින,

EOG 05-0215

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.